1980 දී රජය, යෝජනා ක්‍රම ණය 26 ක් සඳහා ද, ද්‍රව්‍ය ණය 7 ක් සඳහා ද, මුදල් ණයක් සඳහා ද ගිවිසුම් වලට එළඹුනි. මෙහි වටිනාකම රුපියල් දශ ලක්ෂ 8,714 ක් වූ අතර 1979 දී එය රුපියල් දශ ලක්ෂ 6,457 ක් විය. කෙසේ වෙතත් ණය මුදල් උපයෝජනයේ පහත යෑමක් වාර්තා කිරීමට යෙදුනි. 1980 වසර අවසානය වනවිට 1970 සිට එළඹුනු ණය ගිවිසුම් හි මුළු උපයෝජනය සියයට 56 ක් විය. 1979 දී මෙම අනුපාතිකය සියයට 60 ක්ව පැවතින. යෝජනා ක්‍රම ණය සම්බන්ධයෙන් පහළ මට්ටමක උපයෝජනයක් පෙනෙන්නට තිබින. මෙහිදී උපයෝජන අනුපාතය සියයට 36 ක් තරම් පහත මට්ටමක විය. භාණ්ඩ ණය සියයට 81 ක උපයෝජන අනුපාතයක් සටහන් කර ඇති අතර මුදල් ණය සම්පූර්ණයෙන්ම උපයෝජනය කර ඇත.

## මුදල් හා බැංකු කටයුතු

1980 වසරේ මූල්‍ය හා බැංකු කටයුතු සංවර්ධනයන්හි ප්‍රධාන ලක්ෂණයන් වූයේ දේශීය ණය ඉතාමත් තියුණු ලෙස ප්‍රසාරණය වීම හා බැංකු විදේශීය වත්කම් සැළකිය යුතු ලෙස පහත වැටීමත්ය. වර්ෂය තුළදී වූ දේශීය ණය ප්‍රසාරණය රුපියල් දශ ලක්ෂ 11,174 ක් හෙවත් සියයට 80 ක් විය. බැංකු ණයෙහි වැඩිවීම, "පෞද්ගලික" හා "රාජ්‍ය" යන අංශ දෙකෙහිම සිදු විය. වර්ෂය තුළදී පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය රුපියල් දශ ලක්ෂ 5,123 කින් වැඩි වූ අතර, රජයට දෙන ලද ශුද්ධ ණයෙහි වැඩිවීම රුපියල් දශ ලක්ෂ 6,051 ක් විය. මෙම තියුණු, එමෙන්ම සමබර නොවූ ණය ප්‍රසාරණයෙහි බලපෑම, විදේශීය සංචිතයන් හීන කරවීමට හේතු වූ අතරම ගෙවුම් ශේෂය කෙරෙහි ද දැඩි පීඩනයක් ඇති කළේය. මුළුමනින් ගත් කල බැංකු විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 4,096 කින් හෙවත් සියයට 85 කින් පහත වැටුණි. දැඩි ලෙස ණය ප්‍රසාරණය වීමෙන් ඇතිවූ අහිතකර මූල්‍ය තත්ත්වය බැංකු විදේශීය වත්කම් පහත වැටීම මගින් තරමක් අඩු විය. කෙසේවුවද, වසර අවසානය වන විට විදේශීය මූල්‍ය තත්ත්වය සැළකිය යුතු ලෙස දුර්වල විය.

### මුදල් සැපයුම

මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතුවල එකතුවක් වශයෙන් සැලකෙන, පටු නිර්වචනයට අනුව, මුදල් සැපයුම($M_1$) 1980 දී රුපියල් දශ ලක්ෂ 1,759 කින් හෙවත් සියයට 23 කින් ඉහළ නැගුණි. ඉකුත් වසර තුළදී මෙම වැඩිවීම රුපියල් දශ ලක්ෂ 1,733 ක හෙවත් සියයට 29 ක වඩා විශාල ප්‍රමාණයක් විය. ඒ අතර, පුළුල් නිර්වචනයට අනුව මුදල් සැපයුම, එනම්, $M_1$ හා වෙළෙඳ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතුවල එකතුව, 1979 දී වූ රුපියල් දශ ලක්ෂ 4,166 ක හෙවත් සියයට 38 ක වැඩිවීමට අනතුරුව මෙම වසරේදී රුපියල් දශ ලක්ෂ 4,803 කින් හෙවත් සියයට 32කින් ඉහළ නැගුණි. මෙම වර්ධන අනුපාතිකය තවමත් තරමක ඉහළ මට්ටමකින් පැවතුනද, 1980 වසරේ මූල්‍ය සමස්ථයන්ගේ වර්ධන අනුපාතිකයෙහි තරමක අඩුවීමක් දක්නට ලැබුණි. වර්ෂය තුළ මූල්‍ය සමස්ථයන්හි වෙනස්වීම් තරමක් දුරට නොමග යවන සුළුය. 1979 දෙසැම්බර් මස අවසානයට සියයට 29 ක්ව පැවති මුදල් සැපයුමේ වාර්ෂික වර්ධන අනුපාතිකය, 1980 මාර්තු මස අවසානය වන විට සියයට 24 දක්වා පහත වැටුණි. ජූනි මස අවසානය වනතෙක් එම අනුපාතිකය නොවෙනස්ව පැවත, සැප්තැම්බර් මස අවසානය වනවිට සියයට 15 දක්වා සාපේක්ෂ ලෙස පහත් මට්ටමකට ලඟා විය. ඉන් අනතුරුව, නොවැම්බර් මස අවසානය වනවිට එම අනුපාතිකය සියයට 24ක් දක්වා තියුණු ලෙය ඉහළ ගිය අතර, 1980 දෙසැම්බර් මාසයේදී සියයට 23 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. දළ වශයෙන් එම රටාවම අනුගමනය කරමින්, 1979 දෙසැම්බර් මස අවසානයේදී සියයට 38 ක්ව පැවති $M_2$ හි වාර්ෂික වර්ධන අනුපාතිකය මාර්තු මාසයේදී සියයට 24 දක්වා පහත වැටුනු අතර, ජූලි මාසය දක්වා එම මට්ටමෙහි නොවෙනස්ව පැවත, යළිත් 1980 දෙසැම්බර් මස අවසානය වනවිට ක්‍රමයෙන් සියයට 32 දක්වා ඉහළ නැගුණි.

## 1 · 32 සංඛ්‍යා සටහන

## මූල්‍ය සමස්ථයන් 1978 – 1980

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | පටු මුදල් සැපයුම ($M_1$) | | | | | | පුළුල් මුදල් සැපයුම ($M_2$) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1978 | 1979 | 1980 | වෙනස % (1977/1978) | වෙනස % (1978/1979) | වෙනස % (1979/1980) | 1978 | 1979 | 1980 | වෙනස % (1977/1978) | වෙනස % (1978/1979) | වෙනස % (1979/1980) |
| ජනවාරි .. | 5,679 | 6,091 | 7,848 | +35·1 | + 7·3 | +28·8 | 9,222 | 11,297 | 15,118 | +43·5 | +22·5 | +33·8 |
| පෙබරවාරි .. | 5,830 | 6,489 | 7,880 | +31·6 | +11·3 | +21·4 | 9,507 | 12,305 | 15,488 | +41·8 | +29·4 | +25·9 |
| මාර්තු .. | 6,001 | 6,752 | 8,375 | +27·4 | +12·5 | +24·0 | 9,975 | 12,913 | 16,052 | +41·5 | +29·4 | +24·3 |
| අප්‍රේල් .. | 6,025 | 6,727 | 8,384 | +26·4 | +11·7 | +24·6 | 10,097 | 13,018 | 16,379 | +40·0 | +28·9 | +25·8 |
| මැයි .. | 5,876 | 6,694 | 8,289 | +22·2 | +13·9 | +23·8 | 10,006 | 13,229 | 16,316 | +37·1 | +32·2 | +23·3 |
| ජූනි .. | 5,864 | 6,692 | 8,278 | +18·5 | +14·1 | +23·7 | 10,180 | 13,179 | 16,414 | +35·2 | +29·4 | +24·5 |
| ජූලි .. | 5,570 | 6,667 | 8,196 | +13·8 | +19·7 | +22·9 | 10,078 | 13,346 | 16,658 | +33·9 | +32·4 | +24·8 |
| අගෝස්තු .. | 5,523 | 6,895 | 8,240 | +12·4 | +24·8 | +19·5 | 10,063 | 13,548 | 17,100 | +31·0 | +34·6 | +26·7 |
| සැප්තැම්බර් .. | 5,804 | 7,088 | 8,131 | +15·5 | +22·1 | +14·7 | 10,389 | 13,879 | 17,700 | +32·0 | +33·6 | +27·5 |
| ඔක්තෝබර් .. | 5,835 | 7,159 | 8,388 | +15·3 | +22·7 | +17·2 | 10,589 | 14,200 | 18,369 | +31·1 | +34·1 | +29·3 |
| නොවැම්බර් .. | 5,955 | 7,233 | 8,976 | +13·3 | +21·5 | +24·1 | 10,796 | 14,433 | 19,040 | +27·1 | +33·7 | +31·8 |
| දෙසැම්බර් .. | 5,936 | 7,669 | 9,428 | +10·6 | +29·2 | +22·9 | 10,892 | 15,058 | 19,860 | +24·9 | +38·2 | +31·9 |
| මාසික සාමාන්‍යය | 5,825 | 6,846 | 8,368 | +20·2 | +17·5 | +22·2 | 10,149 | 13,367 | 17,041 | +34·4 | +31·7 | +27·5 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

පසුගිය වසර කිහිපය තුළදී $M_1$ හා $M_2$ මූල්‍ය සමස්ථයන්හි ආදයම් සංසරණ ප්‍රවේගයෙහි (පවත්නා, එනම් සාධක මිල අනුව දළ ජාතික නිෂ්පාදනය මූල්‍ය සමස්ථයන්ගෙන් බෙදීම)තරමක පහත වැටීමේ උපනතියක් වාර්තා විය. $M_1$ මූල්‍ය සමස්ථයන් සම්බන්ධයෙන් බලන කල, 1974 සිට 1977 දක්වා කාලච්ඡේදය තුළදී 7·1 ක් වූ සාමාන්‍ය ආදයම් සංසරණ ප්‍රවේගය 1978 දී 6·8 දක්වාත්, 1979 දී 6·5 දක්වාත්,1980 දී 6·6 දක්වාත් පහත වැටුණි. එමෙන්ම, $M_2$ හි ආදයම් සංසරණ ප්‍රවේගය 1974 හා 1977 කාලය තුළදී 4·6 ක සාමාන්‍ය මට්ටමක පැවති, 1978, 1979 හා 1980 යන වර්ෂයන්හිදී පිළිවෙලින් 3·7, 3·3 හා 3·2 දක්වා පහත වැටුණි. ආදයම් සංසරණ ප්‍රවේගයෙහි පහත වැටීමේ උපනතිය මගින් පෙනී යන්නේ මිල මට්ටම් කෙරෙහි පීඩනයක් ඇති කරමින්, භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ වර්ධන අනුපාතිකයට වඩා මූල්‍ය සමස්ථයන්ගේ වර්ධන අනුපාතිකය වැඩි වේගයකින් සිදුවී ඇති බවයි.

1980 වසර තුළදී, මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් රුපියල් දශ ලක්ෂ 407 කින් හෙවත් සියයට 11 කින් වැඩිවූ අතර, මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු ඊට වඩා වැඩි වේගයකින් එනම්, රුපියල් දශ ලක්ෂ 1,352 කින් හෙවත් සියයට 35 කින් වැඩිවිය. මෙහි ප්‍රතිඵලය වූයේ 1979 වසර අවසානයේදී සියයට 51 ක්ව පැවති මුදල් සැපයුමෙහි ($M_1$) ඉල්ලුම් තැන්පතුවල කොටස 1980 අවසානය වනවිට සියයට 56 දක්වා තියුණු ලෙස ඉහළ නැගීමය. ඉල්ලුම් තැන්පතු හා ව්‍යවහාර මුදල් දැරීම පිළිබඳ මහජනයා තුළ ඇති කැමැත්ත සැලකිය යුතු ලෙස වෙනස් වී නොමැති බැව් පසුගිය වසර කිහිපය තුළ ලත් අත්දැකීම් මගින් පෙන්නුම් කෙරුනද, 1980 දී එය කැපී පෙනෙන අයුරින් ඉල්ලුම් තැන්පතු කෙරේ යොමුවී ඇති බැව් පෙන්නුම් කෙරේ. මෙම ප්‍රවනතාවය නොකඩවා පැවතුනහොත්, එය මහජනයා තුළ බැංකු කටයුතු පිළිබඳ පුරුද්ද දියුණු වීමෙහි දර්ශකයක් ලෙස සැලකිය හැකිය. ඉල්ලුම් තැන්පතුවලට වූ ව්‍යවහාර මුදල්වල අනුපාතය අවසාන වශයෙන් මුදල් සැපයුම් ප්‍රමාණය තීරණය කෙරෙන ණය ගුණකය නිර්ණය කෙරෙන වැදගත් සාධකයක් වන හෙයින්, වෙළෙඳ බැංකුවලට ණය මැවීම සඳහා වඩා පැවුල ඉඩ ප්‍රස්ථා සැලසෙනු ඇත.

විමසුමට ලක්වූ වසර තුළදී දක්නට ලැබුණු පටු මුදල්වල මෙන්ම, ආසන්න මුදල්වල ප්‍රසාරණයද $M_2$ හි වර්ධනයට හේතුවිය. පසුගිය වසර තුළදී පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතුවල සිදු වූ රුපියල් දශ ලක්ෂ 2,432 ක හෙවත් සියයට 49 ක වැඩිවීම හා සසඳන කල. 1980 වසර තුළදී එම තැන්පතුවල වූ වැඩිවීම රුපියල් දශ ලක්ෂ 3,044 ක් හෙවත් සියයට 41 කි. මෙම වසරේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතුවල වූ වැඩිවීමෙන් රුපියල් දශ ලක්ෂ 2,442 ක් හෙවත් සියයට 80 ක් "අනෙකුත් පෞද්ගලික අංශයෙහි" වූ අතර, රාජ්‍ය සංස්ථාවන්ගේ කොටස රුපියල් දශ ලක්ෂ 544 ක් හෙවත් සියයට 18 ක් විය. මේ හා සසඳන කල සමුපකාර ආයතනයන්ගේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතුවල වූ වැඩිවීම රුපියල් දශ ලක්ෂ 58 ක තරම් සුළු ප්‍රමාණයකි. කෙසේවුවද, වසරේ මුල් කාලය තුළදී පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතුවල වර්ධන අනුපාතිකයෙහි පහත වැටීමක් දක්නට ලැබුණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය හැක්කේ ආර්ථිකයේ නොකඩවා පැවති උද්ධමනය හේතුවෙන් මූර්ත ආදයම් අනුපාතිකය පහත වැටීමයි. මේ නිසා 1980 මැයි මාසයේදී තැන්පතු පොළී අනුපාතිකයන් ඉහල නැංවීමට සිදුවූ අතර, එතැන් සිට නැවතත් පෞද්ගලික අංශයේ තැන්පතු ඉහළ ගිය බව පෙනී යයි 1980 අවසාන මාස අට තුළදී පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතුවල රුපියල් දශ ලක්ෂ 2,437 ක හෙවත් සියයට 30 ක තියුණු වැඩිවීමක් වාර්තා විය. වර්ෂයේ මුල් මාස 4 තුළදී රුපියල් දශ ලක්ෂ 152 ක පහත් මට්ටමක පැවති සාමාන්‍ය මාසික වර්ධනයක් හා සසඳන කල, අවසාන මාස 8 තුළදී වූ සාමාන්‍ය මාසික වැඩිවීම රුපියල් දශ ලක්ෂ 305 ක් තරම් විය. ඒ අනුව, ඉකුත් වසර තුළදී සිදුවූ රුපියල් දශ ලක්ෂ 203 ක සාමාන්‍ය මාසික වැඩිවීම හා සසඳන කල, 1980 වසර තුළදී වෙළෙඳ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතුවල වූ සාමාන්‍ය මාසික වර්ධනය රුපියල් දශ ලක්ෂ 254 ක් විය.

1980 වසර තුළදී මූල්‍ය ක්ෂේත්‍රයෙහි කැපී පෙනෙන ලක්ෂණය වූයේ රුපියල් දශ ලක්ෂ 11,174 ක් හෙවත් සියයට 80 ක සැලකිය යුතු දේශීය ණය ප්‍රසාරණයයි. කෙසේ වුවද, මෙම ප්‍රසාරණාත්මක බලපෑම, බැංකු ක්‍රමය සතු විදේශීය වත්කම් (ශුද්ධ) හි රුපියල් දශ ලක්ෂ 4,096 ක හෙවත් සියයට 85 ක පහත වැටීමකින් හා බැංකු ක්‍රමයෙහි අනෙකුත් ශීර්ෂයන් (ශුද්ධ) ගේ රුපියල් දශ ලක්ෂ 2,276 ක වැඩිවීමකින් තරමක් දුරට සමහන් කෙරුණි. අනෙකුත් ශීර්ෂයන්හි වැඩිවීමට විශාල වශයෙන් හේතු වූයේ වර්ෂය තුළදී මහ බැංකුවද ඇතුළු බැංකු ක්‍රමයෙහි ලාභ වැඩි වීමය. සංසන්දනාත්මකව බලන කල, ඉකුත් වසර තුළදී දේශීය ණය ප්‍රසාරණය සිදු වූයේ රුපියල් දශ ලක්ෂ 3,624 ක හෙවත් සියයට 35 ක තරම් පහත් මට්ටමකිනි. කෙසේවුවද, බැංකු ක්‍රමය සතු (ශුද්ධ) විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 1,236 කින් හෙවත් සියයට 35 කින් වැඩිවීම නිසා එම ප්‍රසාරණාත්මක බලපෑම තවදුරටත් ශක්තිමත් කෙරුණි. මෙකී සාධකයන්ගෙන් ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම බැංකු ක්‍රමයෙහි අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) රුපියල් දශ ලක්ෂ 695 කින් වැඩිවීම නිසා තරමක් දුරට සමහන් විය. එයින්ද ප්‍රධාන ශීර්ෂය වූයේ වසර තුළදී බැංකු ක්‍රමය ඉපයූ ලාභයයි.

රාජ්‍ය අංශය විසින් දේශීය ණය විශාල වශයෙන් ප්‍රයෝජනයට ගැනීම, 1980 වර්ෂයෙහිදී මූල්‍ය සංවර්ධනයෙහි ප්‍රධාන ලක්ෂණය විය. ඇත්ත වශයෙන්ම, විමසුමට ලක්වූ වසර තුළදී රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශ ලක්ෂ 6,051 කින් හෙවත් සියයට 207 කින් පෙර නොවූ විරූලෙස වැඩි විය. පසුගිය වසරේදීවූ මෙම වැඩිවීම රුපියල් දශ ලක්ෂ 1,057 ක් හෙවත් සියයට 57 ක තරම් ප්‍රමාණයක් විය. 1980 දී බැංකු ක්‍රමය වෙතින් වූ රජයේ ණය ගැනීම් ප්‍රධාන වශයෙන්ම සිදුවූයේ භාණ්ඩාගාර බිල්පත් ස්වරූපයෙනි. බැංකු නොවන මූලාශ්‍රයන් මගින් භාණ්ඩාගාර බිල්පත් වලට සැහෙන පමණ දයකවීමක් සිදු නොවූ නිසා වරින් වර කෙරෙන භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම්වලට දයකවීමට මහ බැංකුවට සිදුවිය. 1980 වසර අවසාන–යට අළුතින් නිකුත් කළ භාණ්ඩාගාර බිල්පත්වලට මහ බැංකුව දයක වූ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9,604 ක් හෙවත් මුළු නිකුතුවෙන් සියයට 98 කි. ඒ අනුව, මහ බැංකුව විසින් රජයට දෙන ලද දළ ණයෙහි රුපියල් දශලක්ෂ 7,123 ක හෙවත් සියයට 185 ක වාර්තාගත වැඩිවීමක් සිදුවිය. නමුත්, වෙළෙඳ බැංකු වෙතින් වූ රජයේ ණය ගැනීම් වසර තුළදී වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 76ක හෙවත් සියයට 9ක තරම් සුළු ප්‍රමාණයකිනි. කෙසේවුවද, බැංකු ක්‍රමය වෙතැති රජයේ තැන්පතු හා මුදල් ශේෂයන් රුපියල් දශ ලක්ෂ 1,147 කින් හෙවත් සියයට 64 කින් සැලකිය යුතු ලෙස වැඩිවීම නිසා රජයට දෙන ලද දළ ණයෙහි තියුණු වැඩිවීමෙන් හටගත් බලපෑම තරමක් දුරට සමහන් කෙරුණි. කෙසේ වුවද, තැන්පතු වැඩිවීමට හේතු වූයේ වසරේ අවසාන මාසයන්හි රජය මහ බැංකු ණය විශාල වශයෙන් ප්‍රයෝජනයට ගත් හෙයිනි. අයවැය හිඟය පියවීමෙහි ලා රජයට බැංකු ක්‍රමය කෙරෙහි බලාපොරොත්තු තැබීමට සිදුවීම නිසා දේශීය ණය ප්‍රසාරණයෙහි රජය සතු කොටස 1979 දී පැවති සියයට 29 සිට 1980 දී සියයට 54 දක්වා කැපී පෙනෙන අයුරින් වැඩි විය.

රජයට මූල්‍ය පහසුකම් සඳහා බැංකු කෙරෙහි බලාපොරොත්තු තැබීමට හේතු වූ ප්‍රධානතම සාධකය වූයේ ප්‍රාග්ධන වැය ඉහළ යාමේ හේතුවෙන් රජයේ වියදම් ඉතා තියුණු ලෙස වැඩිවීමය. ඉකුත් වසරේදී ඇති වූ රුපියල් දශ ලක්ෂ 8,791 ක හා මෙම වසරේ ඇස්ත–මේන්තුවල සඳහන් රුපියල් දශ ලක්ෂ 8,920 ක අයවැය හිඟයන් හා සසඳන කල, 1980 වසරේ අයවැය හිඟය රුපියල් දශ ලක්ෂ 15,270 කි. විදේශීය මූලාශ්‍රයන්ගෙන් හා දේශීය බැංකු නොවන මූලාශ්‍රයන් මගින් අයවැය හිඟයෙන් සියයට 59 ක් පියවා ගැනීමට හැකි වූ අතර සැලකිය යුතු කොටසක් බැංකු ක්‍රමය මගින් පියවා ගැනීමට සිදු විය.

## 1 · 33 සංඛ්‍යා සටහන

### මූල්‍ය සමස්ථයන් සහ ඊට බලපෑ සාධක

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂයන් | 1978 දෙසැම්බර් | 1979 දෙසැම්බර් | 1980 දෙසැම්බර් | වෙනස 1978/79 ප්‍රමාණය | වෙනස 1978/79 සියයට ගණන | වෙනස 1979/80 ප්‍රමාණය | වෙනස 1979/80 සියයට ගණන |
|---|---|---|---|---|---|---|---|
| **මූල්‍ය සමස්ථයන්** | | | | | | | |
| 1. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් .. .. | 3,015·5 | 3,774·2 | 4,180·8 | + 758·7 | + 25·2 | + 406·6 | + 10·8 |
| 2. මහජනයා සතු ඉල්ලුම් තැන්පතු .. .. | 2,920·8 | 3,895·1 | 5,247·3 | + 974·3 | + 33·4 | + 1,352·2 | + 34·7 |
| පටු නිර්වචනයට අනුව මුදල් සැපයුම ($M_1$) .. | **5,936·4** | **7,669·3** | **9,428·2** | **+ 1,732·9** | **+ 29·2** | **+ 1,758·8** | **+ 22·9** |
| 3. වෙළෙඳ බැංකු වෙතැති මහජනයා සතු කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු .. .. | 4,955·7 | 7,388·3 | 10,432·0 | + 2,432·6 | + 49·1 | + 3,043·7 | + 41·2 |
| 3·1 සමූපකාර ආයතන .. .. | 181·6 | 257·7 | 315·4 | + 76·1 | + 41·9 | + 57·6 | + 22·3 |
| 3·2 රාජ්‍ය සංස්ථා .. .. | 541·0 | 1,491·9 | 2,036·0 | + 950·9 | + 175·8 | + 544·1 | + 36·5 |
| 3·3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගනුදෙනු කරුවන් .. | 4,233·1 | 5,638·7 | 8,080·6 | + 1,405·6 | + 33·2 | + 2,442·0 | + 43·3 |
| පුළුල් නිර්වචනයට අනුව මුදල් සැපයුම ($M_2$) .. | **10,891·8** | **15,057·6** | **19,860·2** | **+ 4,165·8** | **+ 38·2** | **+ 4,802·6** | **+ 31·9** |
| **මූල්‍ය සමස්ථයන්ගේ මූලයන්** | | | | | | | |
| 1. දේශීය ණය .. .. | 10,378·0 | 14,002·5 | 25,176·8 | + 3,624·5 | + 34·9 | +11,174·3 | + 79·8 |
| 1·1 රජයට දෙන ලද ශුද්ධ ණය .. .. | 1,863·0 | 2,920·4 | 8,971·9 | + 1,057·4 | + 56·8 | + 6,051·4 | + 207·2 |
| 1·1·1 රජයට දෙන ලද දළ ණය .. .. | 3,875·8 | 4,706·2 | 11,904·6 | + 830·4 | + 21·4 | + 7,198·4 | + 152·9 |
| මහ බැංකුවෙන් .. .. | 3,075·2 | 3,842·7 | 10,965·5 | + 767·5 | + 25·0 | + 7,122·8 | + 185·3 |
| වෙළෙඳ බැංකු වලින් .. .. | 800·6 | 863·5 | 939·1 | + 62·9 | + 7·9 | + 75·6 | + 8·7 |
| 1·1·2 රජයේ තැන්පතු හා මුදල් ශේෂ .. | - 2,012·8 | – 1,785·8 | – 2,932·7 | + 227·0 | + 11·3 | – 1,147·0 | – 64·2 |
| 1·2 පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය .. | 8,515·0 | 11,082·1 | 16,204·0 | + 2,567·1 | + 30·1 | + 5,122·8 | + 46·3 |
| 1·2·1 සමූපකාර ආයතන (අ) .. .. | 1,377·7 | 938·6 | 741·5 | – 439·1 | – 31·9 | – 197·1 | – 21·0 |
| 1·2·2 රාජ්‍ය සංස්ථා .. .. | 2,363·1 | 3,346·9 | 4,122·7 | + 983·8 | + 41·6 | + 775·8 | + 23·2 |
| 1·2·3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගනුදෙනු කරුවන් | 4,774·2 | 6,796·6 | 11,340·7 | + 2,022·4 | + 42·4 | + 4,544·1 | + 66·8 |
| 2. විදේශීය බැංකු වත්කම් (ශුද්ධ) (ආ) .. .. | 3,573·9 | 4,809·6 | 713·7 | + 1,235·7 | + 34·6 | – 4,095·9 | – 85·2 |
| 3. අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) .. .. | - 3,059·9 | – 3,754·6 | – 6,030·3 | – 694·7 | | – 2,275·7 | |
| 3·1 මහ බැංකුවෙහි අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | - 1,247·2 | – 1,827·2 | – 3,141·9 | – 580·0 | | – 1,314·7 | |
| 3·2 වෙළෙඳ බැංකුවල අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | - 1,713·0 | — 2,069·4 | – 2,720·6 | – 356·4 | | – 651·2 | |
| 3·3 සංසරණයෙහි පවත්නා ශීර්ෂ සඳහා ගැළපීම් .. | - 99·7 | 142·0 | – 167·8 | + 241·7 | | – 309·8 | |
| පුළුල් නිර්වචනයට අනුව මුදල් සැපයුම ($M_2$) .. | **10,891·8** | **15,057·6** | **19,860·2** | **+ 4,165·8** | **+ 38·2** | **+ 4,802·6** | **+ 31·9** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.


සටහන : සලකුණු වලින් $M_2$ කෙරෙහි ඇතිවූ බලපෑම දක්වේ.

(අ) කල් පිරෙණ ද්‍රව්‍ය කුවිතාන්සි වට්ටම් කිරීම සඳහා "වී අලෙවි මණ්ඩලය අවිනිශ්චිත ගිණුමෙහි" තබා ගත් මුදල් වෙනුවෙන් ගැලපීම් කර ඇත. මෙම ගැළපීම් 1978, 1979 හා 1980 සඳහා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 296·9, රුපියල් දශ ලක්ෂ 969·3 හා රුපියල් දශ ලක්ෂ 626·7 ක් විය.

(ආ) විනිමය අනුපාතික වෙනස්වීමේ හේතුවෙන් විදේශ වත්කම්හි ඇති වූ වෙනස (එහි ප්‍රති සටහන මහ බැංකුවෙහි අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) හි ගලපා ඇත.) ඉවත් කර ඇත.
මෙය 1978, 1979 හා 1980 අවසානයේදී පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 2,016 ක්, රුපියල් දශ ලක්ෂ 1,998 ක් හා රුපියල් දශ ලක්ෂ 2,917 ක් විය.

## මුදල් සැපයුම


1968 – 75 වර්ෂාවසාන හා 1976 සිට මාසාවසාන සංඛ්‍යා




ශ්‍රී ලංකා මහ බැංකුව.

# මුදල් සැපයුමේ මූලාශ්‍ර

1968 – 75 වර්ෂාවසාන හා 1976 සිට මාසාවසාන සංඛ්‍යා




ශ්‍රී ලංකා මහ බැංකුව.

පසුගිය වසරේදී සිදු වූ රුපියල් දශ ලක්ෂ 2,567 ක හෙවත් සියයට 30ක වැඩිවීමක් හා සසඳන කල, පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,123 කින් හෙවත් සියයට 46 කින් තියුණු ලෙස ඉහළ නැඟුණි. වර්ෂය තුළදී පෞද්ගලික අංශයට දෙන ලද ණයෙහි වර්ධන අනුපාතිකයේ වේගවත් ඉහල යාමක් පැවතියද, දෙවන භාගයේදී වර්ධන අනුපාතිකයෙහි සාමාන්‍ය පහත වැටීමක් දක්නට ලැබුණි. ඇත්තවශයෙන්ම වසරේ ප්‍රථම භාගයේදී පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,210 කින් හෙවත් සියයට 29 කින් වැඩිවූ නමුත්, ද්විතීය භාගයේදී එම ණය වැඩිවූයේ රුපියල් දශ ලක්ෂ 1,916 කින් හෙවත් සියයට 13 කින් පමණි. වසරේ මුල් මාස හය තුලදී රුපියල් දශ ලක්ෂ 535 ක්ව පැවති මාසික සාමාන්‍ය වැඩිවීම, ද්විතීය භාගයේදී රුපියල් දශ ලක්ෂ 319 දක්වා පහත වැටුණි. වසරේ දෙවන භාගය තුළදී පෞද්ගලික අංශයට දෙන ලද දළ ණයෙහි වර්ධනයේ සාමාන්‍ය පහත වැටීම, සමුපකාර ආයතනයන්ට හා රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද දළ ණයෙහි පහත වැටීමක ප්‍රතිඵලයක් විය.

පසුගිය වසරේදී වූ රුපියල් දශ ලක්ෂ 984 ක හෙවත් සියයට 42 ක විශාල වැඩිවීමක් හා සසඳන කල, රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද දළ ණය ප්‍රමාණය 1980 වසරේදී රුපියල් දශ ලක්ෂ 776 කින් හෙවත් සියයට 23 කින් වර්ධනය විය. 1980 වසරේ ප්‍රථම භාගය තුළදී රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද දළ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,033 කින් හෙවත් සියයට 31 කින් වැඩිවූ අතර මාසික සාමාන්‍ය වැඩිවීම රුපියල් දශ ලක්ෂ 172 ක් විය. කෙසේවුවද, වසරේ දෙවන භාගයේදී එම ණයෙහි රුපියල් දශ ලක්ෂ 257 ක හෙවත් සියයට 6 ක සුළු පහත වැටීමක් ඇති කරමින් එයට හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ වර්ධනයක් ඇති විය. රාජ්‍ය සංස්ථාවන්ට දෙන ලද දළ ණයෙහි පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, වසරේ මැද භාගයේ සිට ප්‍රධානතම රාජ්‍ය සංස්ථාවක් විසින් '' ප්‍රතිග්‍රහන මූල්‍ය පහසුකම් '' ස්වරූපයෙන් විදේශීය ණය පහසුකම් ලබා ගැනීමය. කෙසේවුවද, වාණිජ සංස්ථාවන් සහ වැවිලි සංස්ථාවන් වසර මුළුල්ලේම නොකඩවා වෙළෙඳ බැංකු සම්පත් ප්‍රයෝජනයට ගනු ලැබුණි.

පසුගිය වසර තුළදී සිදු වූ රුපියල් දශ ලක්ෂ 439 ක හෙවත් සියයට 32 ක වැඩිවීමකට අනතුරුව සමුපකාර ආයතනයන්ට දෙන ලද දළ ණය ප්‍රමාණය 1980 දී රුපියල් දශ ලක්ෂ 197 කින් හෙවත් සියයට 21 කින් පහත වැටුණි. මෙම ණයෙහි පහත වැටීම බෙහෙවින්ම කැපී පෙනුනේ වසරේ ප්‍රථම භාගයට වඩා ද්විතීය භාගයේදීය. සහතික මිල ක්‍රමය යටතේ වී මිලදී ගැනීම සඳහා දෙන ලද අත්තිකාරම්හි මෙම පහත වැටීම පිළිබිඹු විය. මෙම අත්තිකාරම් වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 179 කින් හෙවත් සියයට 85 කින් අඩුවිය. වී අලෙවි මණ්ඩලය විසින් වර්ෂය තුළදී මිලදී ගත් වී ප්‍රමාණයෙහි තියුණු පහත වැටීම මගින් මෙය වඩාත් පැහැදිලි වේ. 1979 දී වී අලෙවි මණ්ඩලය මිලදී ගත් වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 5,41,221 සිට 1980 දී මෙට්‍රික් ටොන් 2,10,300 දක්වා පහත වැටුණි. අලෙවි සහ වගා අරමුණු සඳහා සමුපකාර ආයතනයන් විසින් ලබාගත් ණයද, වසර තුලදී පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 3 කින් හා දශ ලක්ෂ 9 කින් සුළු වශයෙන් පහත වැටුණි. කෘෂිකාර්මික වෙළඳ ද්‍රව්‍ය අලෙවි කිරීම සම්බන්ධයෙන් සමුපකාර ආයතනයන්ට ඉටු කිරීමට හැකි වූයේ සුළු කාර්යයක් බව, එම ආයතනයන්ට දෙන ලද දළ ණයෙහි තියුණු පහත වැටීමෙන් පෙන්නුම් කෙරේ. මෙයට හේතු වූයේ අනෙකුත් පෞද්ගලික අංශයෙන් ඇතිවූ තරඟයයි.

පසුගිය වසරේදී සිදු වූ රුපියල් දශ ලක්ෂ 2,023 ක හෙවත් සියයට 42 ක වැඩිවීමක් හා සසඳන කල, ''අනෙකුත් පෞද්ගලික අංශයේ'' ගණුදෙනු කරුවන්ට දෙන ලද දළ ණය 1980 වසරේදී රුපියල් දශ ලක්ෂ 4,544 කින් හෙවත් සියයට 67 කින් ඉහළ නැඟුණි. 1980 දෙවන භාගයේදී රාජ්‍ය සංස්ථාවන්ට හා සමුපකාර ආයතනයන්ට දෙන ලද ණය වර්ධනයෙහි අඩුවීමක් දක්නට ලැබුණද, වසර මුළුල්ලේම ''අනෙකුත් පෞද්ගලික අංශයට'' දෙන ලද ණයෙහි ඉහළ වර්ධනයක් වාර්තා විය. 1980 ප්‍රථම භාගය තුළදී ''අනෙකුත් පෞද්ගලික අංශයේ'' ගනුදෙනු කරුවන්ට දෙන ලද බැංකු ණය රුපියල් දශ ලක්ෂ 1,986 කින් හෙවත් සියයට 29 කින් වැඩිවූ අතර, වසරේ ද්විතීය භාගයේදී ද එම ණයෙහි රුපියල් දශ ලක්ෂ 2,558 ක හෙවත් සියයට 29 ක ඒ හා සමාන ඉහළ වර්ධනයක් වාර්තා කෙරුණි. වසරේ දෙවන

භාගයේදී දෙන ලද ණයෙහි අති විශාල වැඩිවීම් හේතුකොට ගෙන ප්‍රථම භාගයේදී රුපියල් දශ ලක්ෂ 331 ක්ව පැවති අනෙකුත් පෞද්ගලික අංශයට දෙන ලද දළ ණයෙහි සාමාන්‍ය මාසික වැඩිවීම දෙවන භාගයේදී රුපියල් දශ ලක්ෂ 426 දක්වා වැඩි විය. විවිධ වර්ගවල ණය මුදල් හා අත්තිකාරම් සම්බන්ධයෙන් අය කළ පොළී අනුපාතිකවල වැඩිවීම් වාර්තා කරමින් 1980 මැයි/ජූනි මාසයන්හිදී ක්‍රියාත්මක කළ පොළී අනුපාතික වෙනස් කිරීම් සැලකිල්ලට ගනිමින් මෙම සංවර්ධනය විමසුමට ලක් කිරීම වැදගත්ය. 1979 දෙසැම්බර් මාසය අවසානයේදී සියයට 13·9 ක්ව පැවති වෙළෙඳ බැංකුවල සාමාන්‍ය හරිත පොළී අනුපාතිකය ජූනි මස අවසානය වන විට සියයට 16·3 දක්වාද, සැප්තැම්බර් මස වනවිට සියයට 17·0 දක්වාද ඉහළ නැඟුණි.

1980 මූල්‍ය සමස්ථයන් කෙරෙහි විදේශීය අංශය මගින් සැලකිය යුතු සංකෝචනාත්මක බලපෑමක් හටගති. මුළුමනින්ම ගත් කල, වර්ෂය තුළදී බැංකු විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 4,096 කින් හෙවත් සියයට 85 කින් පහත වැටුණි. ඇත්ත වශයෙන්ම, මෙකී සංවර්ධනය 1976 සිට පැවති උපනතිය මුළුමනින්ම පිටුදැකීමකි. 1980 වසර තුළදී බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) වල පහත වැටීම මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය (ශුද්ධ) රුපියල් දශ ලක්ෂ 4,677 කින් තියුණු ලෙස පහත වැටීමෙහි හා වෙළෙඳ බැංකුවල විදේශීය වත්කම් (ශුද්ධ) රුපියල් දශ ලක්ෂ 581 කින් වැඩිවීමක සංයුක්ත ප්‍රතිඵලයක් විය.

1980 වසරේදී බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) පහත වැටීම ශ්‍රී ලංකා ගෙවුම් ශේෂයෙහි සැලකිය යුතු පිරිහීමක ප්‍රතිඵලය විය. ආනයන සඳහා වූ වියදම් තියුණු ලෙස වැඩි වීම නිසා වර්ෂය තුළදී වෙළෙඳ ගිණුමෙහි හිඟය සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඉකුත් වසරේදී ඇති වූ රුපියල් දශ ලක්ෂ 7,288 වෙළෙඳ හිඟයක් හා සසඳන කල 1980 දී එය රුපියල් දශ ලක්ෂ 16,140 ක් විය. වෙළෙඳ ගිණුමේ සිදු වූ මෙම හිඟය, ජංගම ගිණුමේ හිඟය විශාල කිරීමටද හේතු විය. 1979 දී රුපියල් දශ ලක්ෂ 3,556 ක්ව පැවති ජංගම ගිණුමේ හිඟය 1980 දී රුපියල් දශ ලක්ෂ 10,739 ක් දක්වා වැඩි විය. දිගුකාලීන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලද සම්පත් සහ වෙළෙඳ ණය ගැනීම් මගින් ජංගම ගිණුමේ ඇති වූ හිඟයෙන් කොටසක් පියවා ගැනීමට හැකි වූ නමුදු, ඉතිරිව පැවති හිඟය පියවා ගැනීමට සංචිතයන් යොදා ගැනීමට සිදු විය.

සමස්ථයක් වශයෙන් ගත් කල, මූල්‍ය සමස්ථයන්ගේ වර්ධනය සැලකිය යුතු ඉහළ මට්ටමක නොවෙනස්ව පැවතියද, එකී වර්ධන අනුපාතිකයෙහි තරමක පසුබෑමක් දක්නට ලැබුණි. පසුගිය වසර කිහිපය තුළදී පැවති රටාවට වෙනස්ව යමින්, තියුණු ලෙස ඉහළ ගිය දේශීය ණය ප්‍රසාරණයෙන් හටගත් මූල්‍ය ප්‍රසාරණය ශුද්ධ බැංකු විදේශීය වත්කම් පහත වැටීමෙන් තරමක් දුරට සමහන් කෙරුණි.

**වෙළෙඳ බැංකු කටයුතු**

ඉකුත් වසර කිහිපය තුළදී පැවති රටාව අනුව යමින් 1980 දී වෙළෙඳ බැංකු සම්පත්වල තියුණු වැඩිවීමක් සිදුවිය. වර්ෂය තුළදී වෙළෙඳ බැංකුවල සම්පත් රුපියල් දශ ලක්ෂ 7,948 කින් වැඩි වූ අතර, එය එක් වසරක් තුළදී සිදු වූ ඉහළම වර්ධනය විය. 1979 දී සම්පත් රාශිකරණයෙහි සිදු වූ රුපියල් දශ ලක්ෂ 4,817 ක වැඩිවීම හා මෙය සැසඳිය හැකිය. 1980 දී වෙළෙඳ බැංකුවල සම්පත් පදනම පුළුල් කිරීමට සියළුම ප්‍රධාන වගකීම් ශීර්ෂයන් දායක විය. ඉකුත් වසර කිහිපය තුළ පැවති රටාව සනාථ කරමින්, මෙම වසරේ සම්පත්හි වර්ධනයට හේතු වූ ප්‍රධානතම සාධකය තැන්පතු වර්ධනයවීම විය. ඉල්ලුම් සහ කාලීන හා ඉතිරි කිරීමේ යන තැන්පතු දෙවර්ගයෙහිම තියුණු වැඩි වීම් වාර්තා වුවද, ඉන් විශාලතම කොටසකට වග කියන ලද්දේ කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතුය. සමස්තයක් වශයෙන්, වසරේ ප්‍රථම භාගය තුළදී මෙම තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකයන් වැඩිකිරීමට අනුකූලතාවයක් දක්වමින්, කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 3,094 කින්

වැඩි විය. තැන්පතු වැඩිවීම මගින් සිදු වූ සම්පත් රාශිකරණය, වෙළෙඳ බැංකුවල අනෙකුත් වගකීම්හි රුපියල් දශ ලක්ෂ 1,591 ක වැඩිවීම නිසා තවදුරටත් වර්ධනය විය. මෙයට විශාල වශයෙන් හේතු වූයේ බැංකුවල ලාභ සහ අවිනිශ්චිතව තබාගත් පොළී මුදල්ය. ගෙවා නිමි ප්‍රාග්ධනය, සංචිත අරමුදල් හා නොබෙදූ ලාභ ආදියෙහි වැඩිවීමද වර්ෂය තුළදී වෙළෙඳ බැංකු සම්පත් වැඩි කිරීමට දායක විය.

අනෙකුත් පෞද්ගලික අංශය සහ රාජ්‍ය සංස්ථාවන් රටෙහි ආර්ථික කටයුතුවලට වැඩි වැඩියෙන් දක්වන ලද සහභාගිත්වය පිළිබිඹු කරමින්, 1980 වසර තුළදී එම අංශයන්ගේ බැංකු ණය ඉල්ලුම ඉහළ මට්ටමක පැවතුණි. පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු ණයෙහි රුපියල් දශ ලක්ෂ 5,123 ක වාර්තාගත වැඩිවීමක් සිදුවිය විශාලතම සම්පත් ප්‍රමාණයක් රාශිකරණය වූ නමුදු, වර්ෂය තුළදී වෙළෙඳ බැංකුවල ද්‍රවශීලතාවය තියුණු විචලනයන්ට භාජනය විය. 1980 පළමු කාර්තුවේදී ප්‍රධාන වශයෙන්ම, විශාල ලෙස ඇති වූ ආනයන ගෙවීම් හේතුකොටගෙන වෙළෙඳ බැංකුවලට කෙටිකාලීන ද්‍රවශීලතා ප්‍රශ්නයන්ට මුහුණ දීමට සිදුවිය. අරමුදල්වල දැඩි අවශ්‍යතාවයක් පිළිබිඹු කරමින්, 1979 වසර අවසානයේදී රුපියල් දශ ලක්ෂ 195 ක් වූ මහ බැංකුවෙන් වෙළෙඳ බැංකු ලබාගත් ණය, 1980 මාර්තු මස අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 1,331 දක්වා තියුණු ලෙස ඉහළ නැගුණි. ද්‍රවශීලතා අවහිරතාවය වසරේ දෙවන කාර්තුව තුළදීද නොකඩවා පැවති අතර, 1980 ජූනි මස අවසානය වන විට මහ බැංකුව වෙතින් වූ වෙළෙඳ බැංකු ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 1,305 ක්ව පැවතුණි. කෙසේවුවද, එතැන් සිට වෙළෙඳ බැංකු ද්‍රවශීලතාවයෙහි කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඒ අනුව, සැප්තැම්බර් මස අවසානය වන විට මහ බැංකුවෙන් ලබා ගත් ණය රුපියල් දශ ලක්ෂ 719 දක්වා පහත වැටුණු අතර, 1980 දෙසැම්බර් මස අවසානය වන විට එය තවදුරටත් රුපියල් දශ ලක්ෂ 686 දක්වා පහත වැටුණි. මෙම යහපත් ද්‍රවශීලතා තත්වය ඉල්ලුම් තැන්පතුවලට වූ ද්‍රවශීල වත්කම් අනුපාතය මගින්ද පිළිබිඹු විය. එකී අනුපාතය 1979 වසර අවසානයෙහි වූ සියයට 88 සිට 1980 වසර අවසානයට සියයට 91 දක්වා ඉහළ නැගුණි.

### 1 · 34 සංඛ්‍යා සටහන

### වෙළෙඳ බැංකු සම්පත් හා ඒවායේ උපයෝගීකරණයේ වෙනස් වීම

රුපියල් දශ ලක්ෂ

| අංශ | 1977 අග/ 1978 අග | 1978 අග/ 1979අග | 1979 අග/ 1980 අග |
|---|---|---|---|
| 1· රජය .. .. | 220·8 | 15·6 | 450·5 |
| 2· මහ බැංකුව .. .. | 126·1 | − 872·2 | 409·2 |
| 3· රාජ්‍ය සංස්ථා .. .. | − 282·0 | 302·6 | 448·6 |
| 4· සමුපකාර ආයතන(අ) .. .. | − 213·8 | 589·8 | 251·9 |
| 5· අනෙකුත් පෞද්ගලික .. .. | − 350·5 | − 60·2 | −1477·2 |
| 6· අන්තර්–බැංකු .. .. | 484·3 | 276·2 | 451·8 |
| 7· විදේශීය .. .. | 15·0 | − 252·1 | − 534·7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) කල් පිරුණු ද්‍රව්‍ය කුවිතාන්සි පියවා දමන තෙක් 'වී අලෙවි මණ්ඩලය අවිනිශ්චිත ගිණුමෙහි' රඳවා ඇති මුදල් සැළකිල්ලට ගනිමින්, සමුපකාර ආයතනයන්ට දෙන ලද ණයවල ගැලපීම් කර ඇත. 1978 1979 හා 1980 යන වර්ෂයන් සඳහා එම සංඛ්‍යාවල වෙනස්වීම්, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ +238·0 රුපියල් දශ ලක්ෂ +672·4 ක් හා රුපියල් දශ ලක්ෂ −342·6 ක් වේ.

වෙළෙඳ බැංකුවල සම්පත් හා ඒවායේ උපයෝගීකරණය පිළිබඳ වෙනස්වීම්, ශුද්ධ පදනමක් මත 1·34 සංඛ්‍යා සටහනෙහි සාරාංශ කොට දක්වා ඇත. අනෙකුත් පෞද්ගලික අංශය සහ විදේශීය අංශය හැර අනෙකුත් සියළුම අංශයන් වර්ෂය තුළදී වෙළෙඳ බැංකු සම්පත් රාශීකරණය කෙරෙහි දයක විය. ස්ථාවර හා අනෙකුත් වත්කම් (රුපියල් දශ ලක්ෂ 1,648) සහ කැට මුදල් දැරීම් (රුපියල් දශ ලක්ෂ 278) වැඩිවීම හේතුකොටගෙන වෙළෙඳ බැංකු ක්‍රමය තුළම සම්පත් ප්‍රයෝජනයට ගැනීම රුපියල් දශ ලක්ෂ 1,926 ක් විය. කෙසේ වුවද, අනෙකුත් වගකීම් රුපියල් දශ ලක්ෂ 1,933 කින් විශාල ලෙස වැඩිවීම සහ ප්‍රාග්ධන සම්පත්වල රුපියල් දශ ලක්ෂ 366 කින් වැඩිවීමද නිසා අන්තර් බැංකු ගණුදෙණු මගින් වෙළෙඳ බැංකුවලින් පිටතට ඇදී ගිය ශුද්ධ සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 452 ක් විය.

වසර තුළදී රාජ්‍ය අංශය විසින් වෙළෙඳ බැංකුවල සම්පත් ප්‍රයෝජනයට ගැනීම රුපියල් දශ ලක්ෂ 140 ක් වූ අතර, මෙම අංශයෙන් වෙළෙඳ බැංකුවලට ඇදී ගිය සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 591 ක් විය. ඒ අනුව, රාජ්‍ය අංශයෙන් වෙළෙඳ බැංකුවලට ලැබුණු ශුද්ධ සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 450 ක් විය. රාජ්‍ය සංස්ථාවලට දෙන ලද වෙළෙඳ බැංකු අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 776 කින් වැඩිවීමත්, ඒවායෙහි තැන්පතු රුපියල් දශ ලක්ෂ 1,224 කින් වැඩිවීමත් නිසා, රාජ්‍ය සංස්ථාවලින් බැංකු වෙතට ඇදී ආ ශුද්ධ සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 449 ක් විය. වර්ෂය තුළදී මහ බැංකුව වෙතින් වූ වෙළෙඳ බැංකු ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 571 කින් වැඩි වූ නමුත්, මහ බැංකුව වෙතැති වෙළෙඳ බැංකු සංචිත වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 161 කින් පමණි. එම නිසා මහ බැංකුව වෙතින් වෙළෙඳ බැංකුවලට රුපියල් දශ ලක්ෂ 409 ක ශුද්ධ සම්පත් ඇදී ඒමක් සිදු වූ අතර එමගින් බැංකුවල ණය මුදල් මැවීමේ හැකියාව ශක්තිමත් කෙරුණි. අනෙක් අතට, වෙළෙඳ බැංකු වෙතැති සමුපකාර ආයතනයන්ගේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 55 කින් වැඩිවීමත්, ඒවායේ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 197 කින් අඩු වීමත් නිසා සමුපකාර අංශයෙන් වෙළෙඳ බැංකුවලට ශුද්ධ සම්පත් ගලා ඒමක් සිදු විය.

මේ අතර, වසර තුළදී වෙළෙඳ බැංකු වෙතින් රුපියල් දශ ලක්ෂ 1,477 ක ශුද්ධ සම්පත් ප්‍රමාණයක් අනෙකුත් පෞද්ගලික අංශයට ඇදී ගියේය. මෙය, බැංකු අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 4,543 කින් හා බැංකු වෙතැති තැන්පතුවල රුපියල් දශ ලක්ෂ 3,066 ක වැඩිවීමක සංයුක්ත ප්‍රතිඵලයක් විය. එමෙන්ම, වෙළෙඳ බැංකු වෙතින් රුපියල් දශ ලක්ෂ 670 ක සම්පත් ප්‍රමාණයක් විදේශීය අංශයට ඇදී ගිය නමුත්, බැංකු ක්‍රමයෙහි සම්පත් රාශීකරණයකට එම අංශයෙන් වූ දයක වීම රුපියල් දශ ලක්ෂ 135 ක් පමණි. ඒ අනුව, විදේශීය අංශය විසින් බැංකු සම්පත් ශුද්ධ වශයෙන් පරිහරණය කළ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 535ක් විය.

බැංකු ශාඛා ව්‍යාප්තිය

1980 වසර තුළදී මුළු බැංකු ශාඛා සංඛ්‍යාව 67 කින් වැඩි විය. මින් ශාඛා 27 ක් ලංකා බැංකුව විසින්ද, ශාඛා 30 ක් මහජන බැංකුව විසින්ද, ශාඛා 3 ක් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින්ද විවෘත කළ නව ශාඛා වන අතර, 7 ක් විදේශීය බැංකු විය. ඉකුත් වසරේදී මෙන්ම, ලංකා බැංකුව විසින් ආරක්ෂක හා ආර්ථික හේතුන් මත එහි කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා ගණනාවක් පිහිට වූ අතර 1980 වසර අවසානය වන විට පිහිටුවන ලද මුළු කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා ගණන 264ක් විය.

විදේශීය ප්‍රාග්ධනය මෙරටට ඇද ගැනීමේ හා බැංකු කටයුතු පිළිබඳ තරඟකාරිත්වය වර්ධනය කිරීමේ අරමුණු ඇතිව, 1977 සිට විදේශීය බැංකුවල ශාඛාවන් ශ්‍රී ලංකාවෙහි පිහිටුවීමට දිරි ගන්වන ලදී. ඒ අනුව, මෙම වසර තුළදී නව විදේශීය බැංකු හතක්

එනම්, ඇමරිකන් එක්ස්ප්‍රස් ඉන්ටර්නැෂනල් බැංකුව (American Express International Banking Corporation,) සීමාසහිත ඕමාන් බැංකුව (Bank of Oman Ltd.), සීමාසහිත ඕවසීස් ට්‍රස්ට් බැංකුව (Overseas Trust Bank Ltd.), ඇමරිකානු බැංකුව (Bank of America), යුරෝපා ආසියානු බැංකුව (European Asian Bank.), නෙදර්ලන්ත ඇල්ජිමේන් බැංකුව (Algemene Bank Nederland N. V.) හා සූරිච් හබීබ් බැංකුව (Habib Bank A. G. Zurich.) විසින් සිය කටයුතු ආරම්භ කරන ලදින් ශ්‍රී ලංකාවෙහි ඇති මුළු විදේශීය බැංකු ශාඛා සංඛ්‍යාව 17 ක් විය. දේශීය බැංකු හතරද ඇතුලුව 1980 වසර අවසානයට දිවයිනෙහි ක්‍රියාත්මකව පැවති මුළු බැංකු සංඛ්‍යාව 21 ක් විය.

වසර තුළදී විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය (FCBUs) ශ්‍රී ලංකාවෙහි සාර්ථක අයුරින් ක්‍රියාත්මකව පැවතුණි. 1979 අවසානයට එම කටයුතුවල නියැලී සිටි විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක සංඛ්‍යාව (FCBUs) 11 ක් වූ අතර, එය මෙම වසර අවසානයට 18 ක් විය. 1979 වසර අවසානයට එ. ජ. ඩොලර් දශ ලක්ෂ 39 (රුපියල් දශ ලක්ෂ 602) ක්ව පැවති මෙම ඒකකයන්ගේ මුළු වත්කම්/වගකීම් 1980 අවසානය වනවිට එ. ජ. ඩොලර් දශ ලක්ෂ 211 (රුපියල් දශ ලක්ෂ 3,796)ක් දක්වා වැඩිවිය.

වසර තුළදී ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් නව ශාඛා 6 ක් විවෘත කරන ලදින් වසර අවසානයට එහි මුළු ශාඛා ගණන 42 ක් විය.


පොළී අනුපාතික

වසරේ ප්‍රථම කාර්තුවේදී දක්නට ලැබුණු ඉහළ නගිමින් පැවති උද්ධමනාත්මක බලපෑම් සහ මූර්ත පලදව සෘණ අගයක් ගැනීම හේතුකොටගෙන ඉතිරි කිරීම්වල වර්ධන අනුපාතිකයේ පහත වැටෙන උපනතිය නිසා 1980 වසර තුළදී කෙටිකාලීන පොළී අනුපාතිකයන් ඉහළ නැංවීම අවශ්‍ය විය. ඒ අනුව, 1980 අප්‍රේල් මස 21 වෙනි දින සිට බල පැවැත්වෙන පරිදි බැංකු පොළී අනුපාතිකය සියයට 10 සිට සියයට 12 දක්වා වැඩි කළ අතර, සියයට 15 සිට සියයට 25 දක්වා පැවති දණ්ඩන පොළී අනුපාතික ව්‍යූහය, වසරකට සියයට 20 සිට 30 දක්වා වැඩි කරන ලදී. බැංකු පොළී අනුපාතිකය කේන්ද්‍ර කොට පැවති අනෙකුත් කෙටිකාලීන පොළී අනුපාතිකයන්ද ඒ අනුව ඉහළ නැංවිණ. භාණ්ඩාගාර බිල්පත්වල පොළී අනුපාතිකය සියයට 9 සිට සියයට 13 දක්වා ඉහළ ගිය අතර, රජයේ සුරැකුම්පත්වල පොළී අනුපාතිකයද වසරකට සියයට 10 සිට සියයට 16 දක්වා වැඩි විය. රජයේ සුරැකුම්පත්හි වර්ෂ 10 සිට 12 දක්වා වූ කල් පිරීමේ කාල සීමාවද වර්ෂ 3 සිට 5 දක්වා කෙටිකරන ලදී. ඒ සමගම, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකයන්ද ඉහළ නංවන ලදී. මෙම ප්‍රතිශෝධනයට අනුව, ඉතිරි කිරීමේ තැන්පතු අනුපාතිකය වසරකට සියයට 8·4 සිට සියයට 12 දක්වා වැඩි වූ අතර, මාස 6 හා මාස 12 හේ ස්ථාවර තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකයන් පිළිවෙලින් වසරකට සියයට 12 සිට සියයට 15 දක්වාද, සියයට 15 සිට 20 දක්වාද වැඩි විය. ඒ අතර, ජාතික ඉතිරි කිරීමේ බැංකුව මාස 18 සඳහා වූ ස්ථාවර තැන්පතු බාර ගැනීමේ පිළිවෙත නවතා දමන ලදී.

බැංකු පොළී අනුපාතිකය, දණ්ඩන පොළී අනුපාතික හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පොළී අනුපාතික ඉහළ නැංවීම කෙරෙහි වෙළෙඳ බැංකු ක්ෂණිකව අනුකූලවූහ. ඒඅනුව, 1980 මැයි මස 2 වෙනි දින සිට වෙළෙඳ බැංකුවල තැන්පතු හා ණය දීමේ අනුපාතිකයන් වැඩි කරන ලදී. මෙම ප්‍රතිශෝධනයට අනුව සියයට 5 සිට 9 දක්වා වූ ඉතිරි කිරීමේ තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකයන් වසරකට සියයට 10 සිට 14 දක්වාද, මාස 3 කාලීන තැන්පතු සඳහා ගෙවන ලද සියයට 8·5 පොළිය සියයට 12 සිට 14 දක්වාද (ඔක්තෝබර් මාසයේ සිට උපරිම පොළී අනුපාතිකය සියයට 16 දක්වා වැඩි කරන ලදී.), මාස 6 කාලීන තැන්පතු සඳහා සියයට 11 සිට 12 දක්වා වූ අනුපාතිකය වසරකට සියයට 15 දක්වා ද (මෙය ඔක්තෝබර් මස සිට වසරකට සියයට 15 හා 18 අතර දක්වා වැඩි කෙරුණි.), මාස 12 කාලීන

# පොලී අනුපාතික

කාර්තු-අවසානයට පැවති සංඛ්‍යා




ශ්‍රී ලංකා මහ බැංකුව

තැන්පතු සඳහා සියයට 14 සිට 15 දක්වා වූ පොළිය වසරකට සියයට 20 දක්වාද වැඩි කරන ලදී. එමෙන්ම වසරකට සියයට 22 පොළිය මත මාස 24 සඳහා තැන්පතු බාර ගැනීමද නැවත ආරම්භ කරන ලදී.

තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකයන්ගේ ඉහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙළෙඳ බැංකුවල ණය දීමේ අනුපාතිකයන්ද සංශෝධනය කෙරුණු නමුත්, බොහෝ බැංකු අත්‍යාවශ්‍ය හා වැදගත් අංශයන්ට විශේෂ පහසුකම් සලසන ලදී. ඒ අනුව, අපනයන කටයුතු සඳහා දෙන ලද අත්තිකාරම්වල පොළී අනුපාතිකය වැඩි වූයේ වසරකට සියයට 16 දක්වා සියයට 2 කින් පමණි. එමෙන්ම, පදිංචිය සඳහා නිවාස තැනීමට අත්තිකාරම් දෙනු ලැබුයේ වසරකට සියයට 13½ සිට සියයට 17 දක්වා වූ අනුපාතිකයන් යටතේය. කෙසේවුවද, අනෙකුත් අරමුණු සඳහා දෙන ලද ණය හා අත්තිකාරම්වල සැළකිය යුතු වැඩි වීමක් ඇති විය. තාවකාලික අයිරා පහසුකම් වසරකට සියයට 18 සිට 30 දක්වාද, පරිභෝජන අත්තිකාරම් වසරකට සියයට 16 සිට 24 දක්වාද, ප්‍රති ණය දීම සඳහා කුලී පිට මිළදී ගැනීමේ සමාගම්වලට දෙන ලද අත්තිකාරම් සියයට 14·5 සිට සියයට 24 දක්වා සහ සංචාරක කටයුතු සඳහා දෙන ලද අත්තිකාරම් සියයට 14 සිට 22 දක්වා ද වැඩිවිය.

ණය දීමේ අනුපාතිකයන් ඉහළ යාම නිසා ඇති වූ ණය පිරිවැය ඉහළ යාම අන්තර්-බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපල කෙරෙහිද බලපෑවේය. ඒක්ෂණ මුදල් වෙළඳපලේ පොළී අනුපාතික 1980 අප්‍රේල් මාසයට පෙර පැවති සියයට 10 හා 14 අතර සිට ජුනි මාසය අවසානය වනවිට සියයට 15·5 හා සියයට 19·5 දක්වාද, ඉන්පසුව 1980 දෙසැම්බර් මාසය වන විට උපරිම පොළී අනුපාතිකය වසරකට සියයට 25 දක්වාද තියුණු ලෙස ඉහළ නැගුණි.

වෙළෙඳ බැංකුවල කෙටිකාලීන ණය දීමේ අනුපාතිකයන් ඉහළ දැමීම අනුව, මධ්‍ය හා දිගු කාලීන ණය දෙන ආයතනයන්ද ඒවායේ ණය දීමේ අනුපාතිකයන් ඉහළ නංවන ලදී. ලංකා සංවර්ධන මූල්‍ය සමායතනයේ ණය දීමේ උපරිම අනුපාතිකය 1980 ජුනි මස සිට බලපැවැත්වෙන පරිදි වසරකට සියයට 16 සිට සියයට 17 දක්වා වැඩිවිය. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවද එහි ණය දීමේ උපරිම අනුපාතිකයන් 1980 මැයි මස 09 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි වසරකට සියයට 18 සිට 19 දක්වාත්, 1980 අගෝස්තු 01 වෙනි දින සිට සියයට 20 දක්වාත් යන පිළිවෙලින් දෙවතාවකදී සංශෝධනය කරන ලදී. 1980 සැප්තැම්බර් 29 වෙනි දින සිට බලපවත්වන පරිදි ජාතික සංවර්ධන බැංකුවද සිය පොළී අනුපාතික සියයට 15 සිට සියයට 17 දක්වා වැඩි කරන ලදී. එමෙන්ම, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ණය දීමේ උපරිම පොළී අනුපාතිකයන්ද අගෝස්තු මාසයේදී සියයට 13 සිට 15 දක්වාත්, නැවතත් දෙසැම්බර් මාසයේදී සියයට 17 දක්වාත් වැඩි කරන ලදී. ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ පොළී අනුපාතිකයන් වසර තුළදී නොවෙනස්ව පැවතුන අතර, මහ බැංකුවේ මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදලේ ප්‍රතිමූල්‍ය ණය පොළී අනුපාතිකයන් 1980 මැයි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි සියයට දෙකකින් වැඩි කරන ලදී.

තවද, බැංකු පොළී අනුපාතිකය, දණ්ඩන පොළී අනුපාතික සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු පොළී අනුපාතිකයන් මූලික වශයෙන් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමස්ථ පොළී අනුපාතික ව්‍යුහයම 1980 ජුනි මාසය අවසානය වනවිට ඉහළ මට්ටමක් කරා වෙනස් විය. ආර්ථිකයේ උද්ධමනාත්මක බලපෑම් වැඩෙමින් පවත්නා පසුබිමක් යටතේ ඉතිරි කිරීම මට්ටම පවත්වා ගැනීමට එවැනි වෙනසක් අත්‍යාවශ්‍ය විය.

මහ බැංකු කටයුතු

පසුගිය වසරේදී මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම්හි සිදු වූ රුපියල් දශ ලක්ෂ 2,597 ක හෙවත් සියයට 18 ක වැඩි වීමක් හා සසඳන කල, 1980 වසර තුළ දී එය රුපියල් දශ ලක්ෂ 5,996 කින් හෙවත් සියයට 36 කින් තියුණු ලෙස වර්ධනය විය.

දේශීය හා විදේශීය වත්කම් දෙවර්ගයෙහිම වැඩි වීම පසුගිය වසර කිහිපය තුළ දී පැවති රටාවට වෙනස්ව, 1980 දී මහ බැංකු වත්කම්වල වර්ධනය දේශීය වත්කම්වලටම සීමාවෙමින්, පෙර නොවූ විරූ පරිදි රුපියල් දශ ලක්ෂ 9,552 කින් හෙවත් සියයට 108 කින් වැඩිවිය. අනෙක් අතට, බැංකුවේ විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 3,556 කින් හෙවත් සියයට 45 කින් තියුණු ලෙස පහත වැටුණි. 1979 වසර හා සසඳන කල එම වසරේදී දේශීය හා විදේශීය වත්කම්වල වැඩිවීම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 768 ක් (සියයට 9) හා රුපියල් දශ ලක්ෂ 1,828 ක් (සියයට 30) විය. වසර තුළදී ජාත්‍යන්තර සංචිතය තියුණු ලෙස පහත වැටීමේ ප්‍රතිඵලයක් වශයෙන්, දෘශ්‍ය වගකීම්වලට (ව්‍යවහාර මුදල් නිකුතුව හා මහ බැංකුවේ ඉල්ලුම් තැන්පතුවල එකතුව) වූ ජාත්‍යන්තර සංචිතයේ අනුපාතය 1979 අවසානයේ පැවති සියයට 91 ක ඉහළම මට්ටමේ සිට 1980 අවසානය වනවිට සියයට 43 දක්වා තියුණු ලෙස පහත වැටුණි.

1975 වසරේ සිට ක්‍රමානුකූලව වර්ධනය වූ මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය1980 දී රුපියල් දශ ලක්ෂ 3,556 කින් සංකෝචනය විය. ඇත්ත වශයෙන්ම මෙම පහත වැටීම පසුගිය දෙවසර තුළ වූ වර්ධනයට සමාන වූවකි. වර්ෂය තුළදී රටෙහි ගෙවුම් ශේෂ තත්ත්වය තියුණු ලෙස පිරිහීම, ජාත්‍යන්තර සංචිතයෙහි ඇති වූ තියුණු පහත වැටීම මගින් පිළිබිඹු කෙරුණි.

වසර තුළදී මහ බැංකුවේ දේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 9,552 කින් වැඩිවිය. බැංකු ණය ගැනීම් කෙරෙහි දැඩි ලෙස එල්බ සිටීම නිසා රජයට දෙන ලද ණයවල රුපියල් දශ ලක්ෂ 7,123 ක වාර්තාගත වැඩිවීමක් සිදු විය. මින් රුපියල් දශලක්ෂ 6,632 ක් රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් දැරීම් ස්වරූපයෙන් වූ අතර, රුපියල් දශ ලක්ෂ 491 ක් රජයට දෙන ලද තාවකාලික අත්තිකාරම් විය. 1979 දී වූ රුපියල් දශ ලක්ෂ 428 ක පහත වැටීමකට ප්‍රතිවිරුද්ධව, අනෙකුත් අයට දෙන ලද ණය මුදල් හා අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 476 කින් වැඩිවිය. මින් රුපියල් දශ ලක්ෂ 357 ක් සිය තාවකාලික ද්‍රවශීලතා ප්‍රශ්න මගහරවා ගැනීමට වෙළෙඳ බැංකුවලට කෙටිකාලීන ණය මුදල් ස්වරූපයෙන් දෙන ලද ණය විය. මූලික වශයෙන් ආසියානු නිශ්කාෂණ සංගමයේ ගිණුමෙහි නොපියවා පැවති ශේෂයෙහි රුපියල් දශ ලක්ෂ 1,316 ක වැඩිවීමක් හේතු කොටගෙන මහ බැංකුවේ "අනෙකුත් වත්කම් හා ගිණුම්" රුපියල් දශ ලක්ෂ 1,869 කින් වැඩිවිය.

වගකීම් අංශය ගත්විට, ඉකුත් වසරේ පැවති රුපියල් දශ ලක්ෂ 812 ක හෙවත් සියයට 23 ක වැඩි වීම හා සසඳන කල, මෙම වසරේදී මහ බැංකුවේ ව්‍යවහාර මුදල් නිකුතුව රුපියල් දශ ලක්ෂ 688 කින් හෙවත් සියයට 16 කින් වැඩිවිය. ජාත්‍යන්තර ආයතනයන්ගේ තැන්පතු හැර, බැංකුවේ තැන්පතු වගකීම් රුපියල් දශ ලක්ෂ 1,023 කින් වැඩි වූ අතර, මින් රජයේ තැන්පතුවල වැඩිවීම රුපියල් දශ ලක්ෂ 617 ක් විය. වසර පුරා දැඩි ලෙස ණය ලබාගැනීම් මධ්‍යයෙහි මෙම තැන්පතු වැඩිවීම සිදු වූ බව සැළකිය යුතුය. මධ්‍ය හා දිගුකාලීන ණය අරමුදලින් සැලසෙන ණය පහසුකම් වැඩි දියුණු කිරීමේ අදහසින්, මහ බැංකුව විසින් මෙම අරමුදලට රුපියල් දශ ලක්ෂ 250 ක් මාරු කරන ලදී. මේ අතර, බැංකුවේ 'අනෙකුත් වගකීම් හා ගිණුම්' රුපියල් දශ ලක්ෂ 3,745 කින් වැඩි විය.

1979 වසරේදී සිදු වූ රුපියල් දශ ලක්ෂ 874 ක සැළකිය යුතු වැඩිවීමකට වෙනස්ව යමින් මෙම වසරේදී බැංකුවේ විදේශීය වගකීම් රුපියල් දශ ලක්ෂ 205 කින් වැඩිවිය. විදේශීය වගකීම්හි ඇති වූ වැඩිවීම, විදේශයන්ගෙන් ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 360 කින් වැඩිවීමෙන් හා විදේශීය රාජ්‍ය ආයතනයන්ගේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 155 කින් පහත වැටීමෙන් ඇති වූ දෙකෙහි සංයුක්ත ප්‍රතිඵලයක් විය.

1977 සිට අනුගමනය කරන ලද මූල්‍ය ප්‍රතිපත්ති 1980 දක්වා නොකඩවා පවත්වා-ගෙන යන ලද අතර මෙම වසරේ අප්‍රේල් මාසයේ පටන් මෙම මූල්‍ය ප්‍රතිපත්තීන්හි කාර්යක්ෂමතාව වැඩිකිරීම උදෙසා තවදුරටත් පියවර ගන්නා ලදී. වර්ෂයේ ප්‍රථම

කාර්තුවේදී මූල්‍ය තත්වයෙහි අසතුටුදයක තත්වයක් පෙන්නුම් කරමින් වර්ෂය අවසාන වනවිට මූල්‍ය සමස්තයන්හි බලාපොරොත්තු නොවූ තරම් වර්ධනයක්, විශේෂයෙන් විශාල වශයෙන් දේශීය ණය ප්‍රසාරණය වීමක් පිළිබිඹු විය. අනුක්‍රමික දණ්ඩන පොළී අනුපාතිකයන් මගින් වෙළෙඳ බැංකු ණය පිරිවැය කෙරෙහි සංවේදිතාවක් අපේක්ෂා කළ නමුදු, වෙළෙඳ බැංකු විසින්, විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ බැංකු දෙක මගින් මහ බැංකුවෙන් විශාල වශයෙන් ණය ලබා ගැනීමට නැවතත් නැඹුරු වූ බවට සාක්ෂි ඇත. පළමුවන කාර්තුව අවසානය වනවිට මහ බැංකු පොළී අනුපාතිකය සහ දණ්ඩන පොළී අනුපාතික යටතේ වෙළෙඳ බැංකු විසින් මහ බැංකුවෙන් ලබා ගත් ණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 394 කින් හා රුපියල් දශ ලක්ෂ 937 කින් තියුණු ලෙස වැඩි විය. විශේෂයෙන්ම ආනයන කටයුතු සඳහා ණය ලබා ගැනීම සම්බන්ධයෙන් වූ දැඩි වාරික ඉල්ලුම සපුරාලන ලද්දේ මහ බැංකුව වෙතින් වැඩිපුර ණය ගැනීමෙනි. තවද, අඛණ්ඩව වසර හතරක් මුළුල්ලේ පැවති අධික උද්ධමනය හේතුකොටගෙන, 1977 අගෝස්තු/සැප්තැම්බර් පොළී අනුපාතික ප්‍රතිශෝධනයෙන් පසුව ඇරඹුන තැන්පතු වර්ධන වේගය අඩුවීමේ ලකුණු පහළ විය. ඒ නිසා එක් අතකින් වෙළෙඳ බැංකුවල ණය මැවීමේ හැකියාව සීමා කිරීමටත්, අනෙක් අතට, ඉතිරි කරන්නන්ට එළදයී පොළී අනුපාතිකයක් ලබා දීමටත් ක්ෂණික පියවරක් ගැනීම අවශ්‍ය විය. ඒ සමගම අපනයන ණය ප්‍රතිමූල්‍ය පහසුකම් වැඩි කරන ලෙස ඉල්ලමින් වෙළෙඳ බැංකු විසින් මහ බැංකුවට ඉල්ලීම් ගණනාවක් ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව, 1980 අප්‍රේල් මස සිට බල පැවැත්වෙන පරිදි අපනයන ණය සම්බන්ධයෙන් වෙළෙඳ බැංකුවලට තවදුරටත් සහනයක් සැලසීමේ අදහසින්, අපනයන ණය ප්‍රතිමූල්‍ය පහසුකම් රුපියල් දශ ලක්ෂ 30 කින් හෙවත් සියයට 15 කින් වැඩි කරන ලදී. ඒ අනුව, බැංකු පොළී අනුපාතිකය යටතේ වෙළෙඳ බැංකුවලට සැපයෙන මුළු අපනයන ණය පහසුකම් ප්‍රමාණය, රුපියල් දශ ලක්ෂ 230 ක් විය. ඒ අතරම නොකඩවා පැවති මූල්‍ය සමස්ථයන්ගේ අධිකතර ප්‍රසාරණයට ප්‍රතික්‍රියා දැක්වීම පිණිස මහ බැංකුව විසින් එතෙක් බලපවත්වන ලද මූල්‍ය ප්‍රතිපත්ති උපකරණයන් තවදුරටත් දැඩි කරන ලදී. 1980 අප්‍රේල් මස 21 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු පොළී අනුපාතිකය වසරකට සියයට 10 සිට 12 දක්වා වැඩි කරන ලදී. වෙළෙඳ බැංකු විසින් මහ බැංකු ණය ගැනීම් කෙරෙහි නැඹුරුවීම තවදුරටත් අධෛර්‍යමත් කරනු පිණිස සියයට 15 සිට 25 දක්වා දණ්ඩන පොළී අනුපාතික ව්‍යුහයද සියයට 20 සිට 30 දක්වා වැඩිකරන ලදී. බැංකු පොළී අනුපාතිකයේ වැඩිවීම අනුගමනය කරමින් භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකය වසරකට සියයට 9 සිට සියයට 13 දක්වා වැඩි කෙරුණි. රජයේ සුරැකුම්පත් පොළී අනුපාතිකයද සියයට 10 සිට සියයට 16 දක්වා වැඩි කරමින් ඒවායේ කල්පිරීමේ කාලසීමාවද සැළකිය යුතු ලෙස අඩුකරන ලදී. ඉහත කී මූල්‍ය ප්‍රතිපත්තිමය පියවර, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ හා වෙළෙඳ බැංකුවල තැන්පතු පොළී අනුපාතිකයන් ප්‍රතිශෝධනය කිරීමෙන් තවදුරටත් ශක්තිමත් විය. වෙළෙඳ බැංකුවල හා අනෙකුත් මධ්‍ය හා දීඝකාලීන ණය දෙන ආයතනයන්ගේ ණය දීමේ පොළී අනුපාතිකයන්ද ඉහල නැඟුණු අතර සමස්ත පොළී අනුපාතික ව්‍යුහයම ඉහළ මට්ටමකට විතැන් විය. මෙකී ප්‍රතිපත්තිමය පියවරයන්ගේ අරමුණු වූයේ මූල්‍ය සමස්ථයන්ගේ අධික ප්‍රසාරණය අඩු කිරීමත්, අනෙක් අතට ඉතිරි කිරීම් මට්ටම දිගටම පවත්වා ගැනීමත් මගින් ආර්ථිකයේ ඉහළ යමින් පවතින උද්ධමනකාරී බලපෑම් සමනය කිරීමය.

මෙම මූල්‍ය ප්‍රතිපත්තිමය පියවරයන්ට අනුකූල වෙමින් මුදල් සැපයුමෙහි ($M_1$) වාර්ෂික වර්ධනය අප්‍රේල් මාසයේදී පැවති සියයට 25 සිට සැප්තැම්බර් මාසයේදී සියයට 15 දක්වා පහත වැටුණි. ඒ සමගම, පිරිවැය වැඩිවීම හේතුකොටගෙන අප්‍රේල් මාසයේදී රුපියල් දශ ලක්ෂ 1,487 ක්වූ මහ බැංකුව වෙතින් ලබාගත් වෙළෙඳ බැංකු ණය සැප්තැම්බර් මස අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 738 දක්වා පහත වැටුණි. මහ බැංකුවේ ණය පහසුකම් පරිහරණය අඩුවීම, අන්තර්-බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳ පලෙහි දැඩි පීඩනයකට හේතු වූ

අතර වසර අවසානය වනවිට ඒක්ෂණ මුදල් වෙළෙඳ පලේ අනුපාතිකයන් පෙර නොවූ විරූ පරිදි සියයට 25 ක මට්ටමක් දක්වා ඉහළ නැඟුණි. මේ අතර ඉහළ තැන්පතු පොළී අනුපාතිකයන්ට අනුකූලතාවයක් දක්වමින් වසර අවසානය වනවිට පුළුල් මුදල් සැපයුමෙහි ($M_2$) සියයට 32 ක වර්ධනයක් වාර්තා විය. 1980 අප්‍රේල් මස අවසානයට $M_2$ හි වූ වාර්ෂික වර්ධනය සියයට 26 කි.

1980 දෙවන කාර්තුවේදී කරන ලද මූල්‍ය ප්‍රතිපත්තීන්හි දැඩි කිරීමක් නොවන්නට, මෙම වසරේ මූල්‍ය තත්ත්වය මීට වඩා අයහපත් වන්නට ඉඩ තිබුණි. ජාත්‍යන්තර සංචිතයෙහි ක්‍රමික හා තියුණු පහත වැටීමක් සිදුවීම මධ්‍යයේ වුවද, දේශීය ණය ඉහළයාම හේතුකොට ගෙන ඉහළ මට්ටමක පැවති මූල්‍ය සමස්තයන්, මිළ මට්ටම් තවදුරටත් ඉහළ යාමට හේතු වූවා විය හැකිය. 1980 අප්‍රේල් මාසයේදී ක්‍රියාත්මක කළ දැඩි මූල්‍ය ප්‍රතිපත්ති වලට අනුකූල වෙමින්, මූල්‍ය සමස්තයන්ගේ වර්ධනය, වසරේ වැඩි කාලයක් තුළදී සාපේක්ෂ වශයෙන් පහත් මට්ටමක පවත්වා ගැනීමට හැකිවිය. කෙසේවුව ද, $M_2$ හි හා $M_2$ හි තියුණු වැඩිවීම වාර්තා වූ 1980 අවසාන මාසයන්හිදී මූල්‍ය තත්වයන්ගේ අයහපත් ලක්ෂණයක් දක්නට ලැබුණි. මෙය, මූල්‍ය ප්‍රතිපත්තීන්හි දුබලතාවයක් නොව විශාල වශයෙන්ම රජය විසින් බැංකු ණය අධික ලෙස ප්‍රයෝජනයට ගැනීමේ ප්‍රතිඵලයකි.

ඉහත සඳහන් මූල්‍ය සංවර්ධනයන් 1981 භාණ්ඩ හා සේවා ඉල්ලුම පාලනය කිරීමෙහි ලා ප්‍රතිපත්තිමය වශයෙන් දෙයාකාරයකින් බලපෑ හැකිය. ප්‍රථම කරුණ නම්, 1980 අවසාන මාස තුළ දී සිදු වූ ඉහළ මට්ටමක පැවති මූල්‍ය ප්‍රසාරණය නිසා 1981 මැද භාගය වනවිට මිළ මට්ටම් තවදුරටත් වැඩිවිය හැකි වීමය. දෙවනුව, ප්‍රමාණවත් මූල්‍ය විනයකින් තොරව, තව දුරටත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීමෙන් බලාපොරොත්තු ප්‍රතිඵල නොලැබී යා හැකිය. එපරිද්දෙන්ම, අපේක්ෂිත වර්ධන හා සේවා නියුක්ති අරමුණු සාක්ෂාත් කරගැනීමෙහි ලා බාධාකාරී විය හැකිය.

## සමාප්තය

ප්‍රධාන වශයෙන්ම, ආයෝජන වේගය කඩිනම් කිරීමට දරූ උත්සාහයන්හි ප්‍රතිඵලයක් වශයෙන් පැන නැඟුණ සමස්ත ඉල්ලුම හසුරුවීමේ කාර්යයෙහිදී, ශ්‍රී ලංකා ආර්ථිකය 1980 වර්ෂයේදී, තදබල පීඩනයනට ලක් විය. ලබාගත හැකි සම්පත් හා සසඳන කල, විශාලත්ව-යෙන් අධික ආයෝජන වැඩපිළිවෙලක් ඔස්සේ සංවර්ධන වේගය කඩිනම් කිරීමේදී මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා 1977 මූලාරම්භව 1980 වර්ෂයේදී දක්නට ලැබුන ආර්ථික වර්ධන ක්‍රියාවලිය තුළින් කැපී පෙනුණි. මූල්‍ය පරිපාලනය, සාමාන්‍ය මිළ මට්ටම හා විදේශීය සංචිත මට්ටම කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරමින් 1980 වර්ෂයේදී ඉල්ලුම් පීඩනයන් වර්ධනය විය. මෙම විචල්‍යයන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය තුළින් පැන නැගුණ සහ ඒවායින් උද්දීපනය වුන උද්ධමනකාරී ප්‍රවනතාවයන් මගින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම කෙරෙහි බලපෑ ආර්ථික පසුබිම සකස් කරනු ලැබිණි. විශේෂයෙන්ම වෙළෙඳ අනුපාතයෙහි හට ගත් තියුණු පිරිහීම් ඇතුළු ජාත්‍යන්තර ආර්ථික රටාවෙහි ඇති වූ අවාසිදායක බලපෑම් හේතුවෙන් ආර්ථිකය පාලනය කිරීමේ කාර්යය දුෂ්කර එකක් බවට පත් විය.

අයවැය මගින් වැඩි කරන ලද වියදම්වල බලපෑමෙන් 1980 වර්ෂයේදී රජයේ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 13,693 ක් වූ ඉහළ මට්ටමකට නැඟුණි. එකී මුදල් ප්‍රමාණය 1979 වර්ෂයේ රුපියල් දශ ලක්‍ෂ 8,991 හා 1978 රුපියල් දශ ලක්ෂ 6,614 සමග සසඳා බලන කල, පුළුල් වශයෙන්, ප්‍රාග්ධන වියදම්වල වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙසේ එක් අතකින් මුළු වියදම් වැඩිවෙද්දී, අනිත් අතින් ආදයමේ වර්ධනය සුළු වශයෙන් සිදු වීමේ ප්‍රතිඵලය වූයේ රුපියල් දශ ලක්ෂ 15,270 ක විශාල අයවැය හිඟයක් ඇති වීමය.

මෙබඳු විශාල අයවැය හිඟයක් පියවීම සඳහා රජයට දේශීය මෙන්ම විදේශීය මූලයන්-ගෙන්ද ණය ගැනීමට සිදු විය. විදේශ විනිමය ලැබීම් මගින් දේශීය සැපයුම පුළුල් කිරීමට හැකිවේ නම් සහ ඒ අතරම, රට සතු විදේශීය සංචිතය අඩු වීම සීමා කළ හැකි වේ නම්, ඒ තාක්

දුරට විදේශ ණය මුදල් ලබා ගැනීම මගින් අයවැය හිඟය පියවීම සාපේක්ෂ වශයෙන් උද්ධමන–කාරී නොවන බව පෙන්වා දිය හැකිය. දේශීයව බැංකු නොවන මූලයන්ගෙන් ණය ගැනීම යනු දැනටමත් උපදවා ඇති ආදායම් වලින් මූර්ත සම්පත් ප්‍රයෝජනයට යොදා ගැනීමක් හා ආදායම් ප්‍රවාහයෙන් කොටසක් ඉවත් කිරීමත් වන නිසා උද්ධමනකාරී තත්ත්වයකට තුඩු නොදෙන සුළුය. එහෙත්, බැංකු අංශයෙන්, විශේෂයෙන්ම මහ බැංකුවෙන් ණය ගැනීම නිශ්චිත වශයෙන්ම උද්ධමනකාරී තත්වයකට මග පෑදීමක් වන අතර එමගින් ගෙවුම් තුලනය කෙරෙහි ද පීඩනයක් ඇති කෙරෙයි. මන්දයත්, එවැනි සම්පත් අළුතින් මවන ලද මුදල් වීම පමණක් නොව එමගින් බැංකු ක්‍රමය සතු ද්‍රවශීලතා පදනම පුළුල්වීමද සිදුවන බැවිනි.

1980 අයවැය හිඟය පියවීම සඳහා මූල්‍යකරණය පිණිස යොදා ගත හැකිව තිබූ විදේශීය ආධාර හා දේශීය වෙළඳපල ණය ගැනීම් වැනි සම්පත් සීමාසහිත විය. උද්ධමනකාරී නොවන මුදල් මාර්ග හිඟ තත්ත්වයක් යටතේ, රජය හිඟ ශේෂය පියවා ගත්තේ මහ බැංකුව වෙතින් ණය ගැනීමෙනි. මහ බැංකුවෙන් ලබා ගත් මෙම වැඩිපුර ණය ඉස්මතු වූයේ භාණ්ඩාගාර බිල් පත් අළුතින් නිකුත් කිරීම් වශයෙනි. අනාගෙවා ඉතිරිව ඇති භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 6,800 කින් වැඩි වූ අතර මහ බැංකුව විසින් දරනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය රුපියල් කෝටි 70 කින් පමණ ඉහළ නැඟුණි. මෙම වැඩි කිරීම්වලට ඉඩ සැලසීම සඳහා භාණ්ඩාගාර බිල්පත් නිකුතුව සඳහා පනවා තිබූ සීමාවන් ඉහළ නංවන ලදී. රජය විසින් අයවැය හිඟය පියවීමේදී අනුගමනය කළ උද්ධමනකාරී මුදල් පිළිවෙත නිසා ආර්ථිකයට ඇති වූ බලපෑම වූයේ මුදල් සැපයුම ඉහළ යාමත් ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් මට්ටම ප්‍රසාරණය වීමත්ය. රජයේ වියදම් වැඩිවීම තුලින් මෙන්ම, වෙළෙඳ බැංකු මගින් පෞද්ගලික අංශයට දෙනු ලබන ණය ප්‍රමාණයේ වැඩි වීම තුළින්ද, රටෙහි සමස්ත ඉල්ලුම් ප්‍රසාරණයට මග පෑදුණි.

වර්ෂය තුළදී, බැංකු මගින් පෞද්ගලික අංශය වෙත දෙනු ලැබූ ණය රුපියල් දශ ලක්ෂ 4,780 කින් හෙවත් සියයට 40 කින් ඉහළ ගියේය. පෞද්ගලික අංශයට දෙනු ලබන ණය මට්ටම සැළකිය යුතු ඉහළ මට්ටමක පැවති නමුදු, භාණ්ඩ සහ සේවා සැපයීමෙහිලා මෙම අංශය විසින් ඉටු කෙරෙන කාර්යභාරය සැළකිල්ලට ගත් කළ එකී අංශය වෙත සැපයෙන ණය කපා හැරීම එතරම් යෝග්‍ය නොවන බව සලකන ලදී. පෞද්ගලික අංශය වෙත දෙනු ලබන ණය දැඩි ලෙස කපා හැරීමෙන් දේශීය ආර්ථිකය කෙරෙහි ඇති විය හැකි වූ හානිකර බලපෑම් ගැන මහ බැංකුවේ අවධානය යොමුවී තිබුණි. මෙම තත්ත්වය යටතේ, ණය පාලනය පිළිබඳ සම්ප්‍රදයයික මාර්ගයන් කරා නැඹුරු වෙමින්, බැංකු අනුපාතය වෙනස් කිරීම් සහ සාකච්ඡා මගින් පෙළඹවීම් ආදී වඩාත් ප්‍රායෝගික ක්‍රම ණය හසුරුවීම සඳහා යොදා ගැණුනි.

1980 වර්ෂයේදී ආනයන සඳහා මුදල් සැපයිය හැකි තත්ත්වයක විනිමය සංචිත පැවතීම මිළ මට්ටම ඉහළ නැගීමේ වේගය සමනය කිරීමට පිටිවහලක් විය. 1980 වර්ෂයේදී, කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍යය සියයට 26 කින් ඉහළ යාමක් දක්නට ලැබුණි. මහ බැංකුවේ තොග මිළ දර්ශකයෙහි ද ඉකුත් වර්ෂය හා සසඳන කල 1980 දී, වඩා අධික ඉහළ යාමක් දිස් විය. 1979 වර්ෂයේ සියයට 9 ක වැඩිවීම සමග සසඳා බලන විට, දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය 1980 වර්ෂයේ දී සියයට 34 කින් ඉහළ ගියේය. මුදල් සම්භාරයන්හි ඉහළ යාමද මෙබඳුම ප්‍රමාණයන්ගෙන් සිදුවිය. විදේශ සංචිතවල සියයට 72 ක පිරිහීම ද නොතකා මුදල් සැපයුම (එම්$_1$ සම්භාරය සියයට 23 කින් හා එම්$_2$ සම්භාරය සියයට 32 කින්) ඉහළ ගියේය. මේ අනුව, ගෙවුම් තුලනය කෙරෙහි ඇති වූ පීඩනය හේතුවෙන් සෙසු ප්‍රධාන ව්‍යවහාර මුදල් ඉදිරියෙහි ශ්‍රී ලංකා රුපියලේ අගය හීන වීමක් සිදුවිය. විනිමය අනුපාතයේ පිරිහීම වඩාත් කැපී පෙනුනේ වර්ෂයේ දෙවැනි භාගය තුළදීය. 1980 දී ශ්‍රී ලංකා ආර්ථිකයෙහි විද්‍යමාන වූ වර්ධන රටාවෙන් එනම්; වියදම් ඉහළ මට්ටමක පැවතීම, මුදල් සැපයුමෙහි වැඩි වීම, විදේශ සංචිතයන්ගේ හීනවීම හා විනිමය අනුපාතිකය පිරිහීම යනාදියෙන්, ඒත්තු යනුයේ ලබාගත හැකි මූර්ත වත්කම් ඉක්මවා යන සමස්ත ඉල්ලුම් මට්ටමක් තව

දුරටත් දරා සිටීමට ආර්ථිකයක් අපොහොසත් වන බවයි සමස්ත ඉල්ලුමේ වැඩිවීම හේතුකොට ගෙන ආර්ථිකය "අධි තාපනයට" භාජනය වීමට ඉඩ ඇති හෙයින් මේ සඳහා දීර්ඝකාලීන පිළියමක් ලෙස පෙනී යන්නේ ඉල්ලුම් මට්ටමේ අඩුවක් ඇති කිරීම පමණි.

රජයේ අයවැය ලේඛනය මෙන්ම පෞද්ගලික අංශයේ ණය අවශ්‍යතා පිළිබඳවද නිශ්චය කළ යුත්තේ ණය ගැනීම්/ණය දීම්, ලැබිය හැකි වර්ධන අනුපාතයන් සහ ආනයන අවශ්‍යතාවයනට ප්‍රමාණවත් යයි හැඟෙන විදේශ සංචිත මට්ටමක් ආදිය සම්බන්ධව ප්‍රායෝගික ඉලක්කයන් සැලකිල්ලට ගැනීම මගිනි.

අයවැය ලේඛනය සම්බන්ධයෙන් සලකන කල රජයේ වියදම් හා රජයේ ආදායම් අතර වඩාත් ආසන්න තුලනයක් පවත්වාගෙන යාම, සමස්ත ඉල්ලුම් හසුරුවීමේදී ප්‍රයෝජනවත් පියවරක් වනු ඇත. රටේ ආදායම් වැඩිවීමට අනුව ඉහළ යාමට ඉඩකඩ සැලසෙන පරිදි රජයේ ආදායම් පදනම සැකසීම ගැන සුපරික්ෂාකාරීව ක්‍රියා කිරීම අත්‍යවශ්‍යය. බැංකු ණය ලබා ගැනීම් සීමා කිරීම සඳහා තවත් ඵලදායී ක්‍රියා මාර්ගයක් වශයෙන් ඉතුරුම් එක්රැස් කිරීම හැඳින්විය හැක. පෞද්ගලික අංශයේ දෘෂ්ටි කෝණයෙන් බලන විට, රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය යන දෙකින්ම ප්‍රයෝජනයට ගන්නා වූ සම්පත් වෙන් වශයෙන් නිශ්චය කිරීමටත්, එකී සම්පත් භාණ්ඩ සැපයුම් වර්ධන අනුපාතයන් සමග සසඳා බැලීමටත් හැකිවන පරිදි ණය සැලැස්මක් පිහිටුවීම ආර්ථිකය මනා ලෙස හසුරුවීමට ඉවහල් වනු ඇත. ආර්ථිකයේ "අධිතාපනයෙන්" ඇති වන අවාසිදායක තත්වයන් මග හරවමින්, එක් අංශයක් පමණක් අරමුදල් නතු කර ගැනීම වලක්වමින්, ආර්ථික වර්ධන ඉලක්කයන් සපුරා ගැනීම උදෙසා ප්‍රයෝජනවත් උපකරණයක් ලෙස එබඳු ණය සැලැස්මක් සැලකිය හැකිය.